000 00051

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

THE OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
අවසාන පරීක්ෂණය -2010/2011

**ESP 1134 – විශේෂිත තත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම**

කාලය පැය තුනයි.

---

දිනය - 2012 මැයි මස 13 වන දින          වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද දෙවන කොටසින් තෝරාගත් ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සෙමින් මනස වර්ධනය සහිත සිසුන්ගේ චර්යා අනුවර්තනයන්හි සීමාවන් පහක් (05) සඳහන් කරන්න.

02. සුලභ දෘෂ්ටි ඌනතා තත්වයන් පහක් (05) සඳහන් කරන්න.

03. ශ්‍රවණ ඌනතාවය ඇතිවන ආකාර හතරක් (04)ලැයිස්තු ගත කරන්න.

04. "කායික ඌනතාවය" නිර්වචනය කරන්න.

05. අනවධානශීලී අවධාන ඌණතා අධික්‍රියාකාරී අක්‍රමතාවය සහිත පුද්ගලයකුගේ ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

06. මස්තිෂ්කාඝාතයේ ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

07. 'කටහඬෙහි අක්‍රමිකතාව' පෙන්නුම් කරන ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

08. සුහග තත්ත්වයේ ප්‍රජානන හැකියාවන් පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. (i) "විශේෂ අධ්‍යාපනය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අධ්‍යාපනය සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපනය ලබා දෙන ක්‍රමයන් විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) 'බුද්ධිමය දුබලතාවය' යන පදයෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 05)

(ii) බුද්ධිමය දුබලතා තත්වයේ බුද්ධි පරාසයන් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05)

(iii) පාසල් වියේ පසුවන බුද්ධිමය දුබලතා තත්වයේ සිසුවකු සමඟ වැඩ කටයුතු කිරීම විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

11. (i) සුභග සහ සහජ දක්ෂතාවය නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාව තුල සුභග සහ සහජ දක්ෂතාවයෙන් යුත් සිසුන්ට ඇති අධ්‍යාපන පහසුකම් පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) සුභග සහ සහජ දක්ෂතාවයෙන් යුත් සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කිරීම පිළිබඳ ඔබගේ අදහස් යෝජනා කරන්න. (ලකුණු 10)

12. (i) චර්යා අක්‍රමිකතාවය සහිත සිසුන් තුලින් විද්‍යාමාන වන ලක්ෂණ මොනවා ද? (ලකුණු 05)

(ii) චර්යා අක්‍රමිකතාවය සහිත සිසුන්ගේ අවශ්‍යතා සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) චර්යා පාලන උපාය මාර්ග කිහිපයක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) අධ්‍යාපනික කටයුතු සඳහා දෘෂ්ටි ඌනතා සහිත සිසුන් පිළිබඳ විස්තර කිරීමේ දී භාවිතා කරන යෙදුම් මොනවා ද? (ලකුණු 05)

(ii) දෘෂ්ටි ඌණතාවයේ පොදු ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) දෘෂ්ටි ඌණතා සහිත සිසුන් සඳහා භාවිතා කරන ඉගෙනුම් උපකරණ පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 10)

14. (i) "මනෝවික්ෂිප්ත පරාසීය අක්‍රමිකතා" (Autism Spectrum Disorders) නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) මනෝවික්ෂිප්ත පරාසීය අක්‍රමිකතාවයෙහි පොදු ගුණාංග විස්තර කරන්න. (ලකුණු 05)

(iii) ඉහත තත්වයේ සිසුන්ට අධ්‍යාපනික සහය ගුරුවරුන් විසින් ලබා දිය හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -